## පැරණි ලක්දිව දඬුවම් ක්‍රම පිළිබඳ විග්‍රහයක්

දිනෙන් දින ඉහළ යන අපරාධ රැල්ල අද බරපතල සමාජ ව්‍යසනයක් බවට පත්ව තිබේ. අපරාධ වන වචනය සිංහල භාෂාවට පැමිණියේ සංස්කෘත භාෂාවෙනි. වෛදික සංස්කෘතියේ පටන්ම අපරාධ යන වචනය භාවිතයෙහි දක්නට ලැබේ. අනුරාධපුර අවධියේ සිට දඹදෙණි අවධිය දක්වා ලියැවුණු සෙල්ලිපිවලින් ද සීගිරි ගී වලින් ද පුරාණ අවධියේ අපරාධ සම්බන්ධයෙන් තොරතුරු දක්වා ඇති ආකාරය පැහැදිලි වෙ. අපරාධ ගැන වර්ගීකරණයක් කිරීමේදී කොටස් තුනක් යටතේ එකල පැවති අපරාධ හඳුනාගත හැකිය. එනම්,

1. රාජ්‍ය පිළිබඳ අපරාධ.
2. පුද්ගලයන් පිළිබඳ අපරාධ.
3. දේපල පිළිබඳ අපරාධ.[1]

රාජ්‍ය පිළිබඳ අපරාධ කොටස් හයකි. රජ පවුලේ අය මැරීමට තැත් කිරීම. (කුමන්ත්‍රණය කිරීම.) රජ බිසවගේ හිරි ඔතොප් බිඳීම හෝ අනාචාරයට පොළඹවා ගැනීම,රජතුමාගේ අන්තඃපුර ස්ත්‍රීන්ගේ හිරිඔතප් බිඳීම හෝ අනාචාරයට පොළඹවා ගැනීම, යුදගිනි ඇවිලීම, රාජ ද්‍රෝහි ක්‍රියා සඳහා කුමන්ත්‍රණය කිරීම, මහරජුට එරෙහිව කුමන්ත්‍රණය කිරීම ආදිය වේ. පුද්ගලයන් පිළිබඳ අපරාධ සැලකීමේදී මිනී මැරුම්, සිය පන නසාගැනීමට තැත් කිරීම බරපතල තුවාල කිරීම, හිරිඔතප් බිඳීම, ස්ත්‍රී දූෂණය, අනාචාරයේ හැසිරීම යනුවෙනි. දේපල ගිනි තැබීම, හොර කාසි ගැසීම තැත් කිරීම ආදිය පුරාණයේ පැවැති අපරාධ වශයෙන් ගෙන හැර දැක්විය හැකිය.

පුද්ගලයන් අපරාධයෙන් වැලැක්වීමට දඬුවම් පැමිණවීම පිළිගත් බෞද්ධ සමාජ පාලන විධියකි. දඬුවම ට හියෙන් අපරාධවලින් වැලකී සිටිම දණ්ඩන භය යනුවෙන් හැඳින්වේ. බුද්ධ කාලීන භාරත සමාජයේ වැරැදි කළවුන් උදෙසා රාජතන්ත්‍රය මගින් ක්‍රියාත්මක කරන ලද වධ 26 ක් ගැන අංගුත්තර නිකායේ වජ්ජ සූත්‍රයේ සඳහන් වේ.[2] මේ දඬුවම්වලට පසු තවත් වධ හයක් එකතු වී " දෙතිස් වධ" යනුවෙන් ප්‍රකට විය.[3] මෙම වධ රාජ්‍ය පාලනය පැවැති මෑත භාගය වනතෙක් පැවත ආ බව රොබට්ස් නොක්ස්ගේ වාර්තාවලින් පැහැදිලි වේ.[4] දෙතිස් මහා දඬුවම් වන්නේ වේ වැලෙන් තලනු, තටු හැම්ටියෙන් තලනු, මුගරින් පහරිනු, අත් කපනු, පා කපනු, අත් පා කපනු, කන් පලනු, නාසය කපනු, කන් නාස කපනු, හිස කබල ගලවා කලාල තොඩි මඩිනු, වුවෙහි රෙදි කඩ ඔබා ගිනි දන්වලු, දැත් තෙල් කඩින් වෙලා ගිනි දල්වනු, ගෙලෙහි පටන් පහළට ද දැකයෙහි පටන් ඉහළට ද හම අරිනු, ඇස් උගුල්වනු, බිලියෙන් මස් ඉරනු, කහවනු පමණ කොටා මස් ලියනු, සිරුරෙහි නියදිලා කාරම් ගල්වනු, ඇලයෙහි හොවා කණ උල් ගසා පයින් ගෙන සීසනු, සිරුරෙහි ඇට මස් පිදුරු බිස්සක් වනතෙක් තලනු, උණු තෙල් ඉසිණු, බල්ලන් ලබා හපවනු, දිවෙස් හුලැ හිඳවනු, වද බෙර වයනු, හිසගසා ලනු, රටින් නෙරපනු, හිස මුඩු කරනු, දඟ ගෙයි ලනු, හැකිල්ලෙහි ලනු යනුවෙනි.

දෙතිස් වධ පැමිණවීමේ විධි එක්ව තෙතිස් අධිකණ විධි සංග්‍රහ වී ඇතැයි තිසර දීපනියෙහි මුනිදාස කුමාරතුංග පවසයි. තාඩන පීඩන ක්‍රමවලින් වැරැදිකරුවන් හික්මවා ශෝධනය කළ සිංහල සමාජයෙහි ඉහත කී දඬුවම් තිස්දෙකම දුන් බවට නිදසුන් එතරම් නැති බවට පෙනේ. සිංහල ආණ්ඩුව තුළ බහුල වශයෙන් භාවිතයෙහි ලැබුණෙත් මීට වඩා සැහැල්ලු දඬුවම් විධියකි. සිංහල සමාජයේ අපරාධවලට වරදකරුවන් වෙනුවෙන් නියම කරන ලද දඬුවම් දෙස විමසිලිමත්ව බලනවිට පැහැදිලි වන්නේ එම දඬුවම් තුළින් දැක්වෙන, යහපත් වචනය, යහපත් කර්මාන්තය, යහපත් දිවි පැවැත්ම තුළින් යහපත් සමාජයක් පාදක කරගැනීමට අරමුණු කර ගත්තේය. 'මාඝාත' වැනි පරපණ නැසීමෙන් වැළැක්වීමේ නීතිරීති හැරුණ විට සොරකම හෝ වෙළඳාම, හොර මිනුම් කිරුම්, අල්ලස් ගැනීම් වෙනුවෙන් ද පැනවුණු අණපනත් ඇත. වරදකරුවන්ට දඬුවම් පැමිණවීම නිග්‍රහ කොට ඔවුන් වරදින් මුදවා යහපත් පුරවැසියන් කිරීමට හැකිවිය.

පුරාතනයේ පැවති දඬුවම් අතර ප්‍රධාන වූයේ 'මහදඬුවම' හෙවත් මරණ දඬුවමයි. නොයෙක් ක්‍රමවලින් මරණ දඬුවම පැමිණ වූ බව පෙනේ. උල සිටුවීම, අත්පිටිකර බැඳ කඩවලින් තලමින් ගෙනයෑමෙන් සිරුරේ ලණුහු ගල්වා රත්මල් වඩම් ගෙල එල්ලා වීදි දිගේ පෝරකය දක්වා ගෙන ගොස් මරණයට පත් කිරීමයි. ඊට අමතරව දියේ ගිල්වීම, පෙකනිය දක්වා සිටුවා පස් ගැසීමෙන් ද ඇතුන් ලවා පෑගවීමෙන් ද ගස් බැඳ මඩු වල්ගාවලින් තලා පිටහම් කිරීමෙන් ද පරණ දඬුවම දුන්බව පෙනේ. දඬුවම නියම කිරීම, පැමිණවීම, ලිහිල් කිරීම සහ දඬුවම්වලින් නිදහස් කිරීම ද රජවරුන්ගේ අභිමතය මත රඳා පැවතුණේය.

මරණ දඬුවම පිණිස නොයෙක් ක්‍රම අනුගමනය කළ බව පෙනේ. දෙතිස් වධ විභාගකර බැලීමේදී එම වධහිංසා බොහොමයක් මරණයෙන් කෙළවර විය. මරණ දඬුවම සඳහා සිදු කළ යුතු අපරාධ අතර මිනිමැරීම ප්‍රධාන විය. මංකොල්ලකෑම, සොරකම, මීහරකුන් එළ හරකුන් මැරීම, මරණීය දණ්ඩනය ලැබීමට සුදුසු අපරාධ ලෙස මෙවර භාවිතයේ පැවතිණ. පැරණි ලක්දිව නීතිය යටතේ රාජ ද්‍රෝහීන්ට දුන් ඉහළම දඬුවම වූයේ මරණයයි. පඬුවස්දෙව් රජුගේ (ක්‍රි.පූ. දෙවන සියවස) එකම දියණිය වූ චිත්‍රා කුමරිය උපන් අවස්ථාවේ ඇය දුටු බ්‍රාහ්මණයන් "ඇගේ පුතකු රජය පිණිස මයිලන් නසන" බවට කළ අනාවැකිය අනුව ඇය මැරීමට සහෝදරයෝ තීරණය කළහ.[5] රජු බලයෙන් පහ කිරීමට උත්සහ කිරීම මරණීය දඬුවම ලැබෙන වරදක් බව පණ්ඩුකාභය කුමරු උපන් පසු ඔහු යැයි සිතා බොහෝ දෙනෙකු මරා දැමූ බවට මහාවංශයේ එන විස්තරයෙන් තවදුරටත් පැහැදිලි වේ.[6] එළාර රජතුමා සිය පුතුට මරණ දඬුවම පැමිණ වූයේ ඔහුගේ හිස රියකට යට කරවීමෙනි. එමෙන්ම සුභ රජු (ක්‍රි.ව. 59-65) "වසභ යන නම් ඇමතියෙක් රජ වන්නේ යැයි" අසා ඒ නම ඇති සියල්ලන්ම මැරූ බව මහාවංශයේ දැක්වේ.[7] එමෙන්ම ක්‍රි.පූ. 92- 82 කාලයේ රජ කළ කානිරාජානුතිස්ස රජතුමා වරද කළ භික්ෂූන් පිරිසක් රාජාපරාධයට දඬුවමක් ලෙස ලෙනක සිර කොට තබා මරණයට පත්කොට තිබේ.[8] තවද ඉලනාග රජු රාජ්‍යද්‍රෝහී වූ ලම්භකරණයන් දෙදෙනා බැගින් රථවලට හසුකර මැරීමට නියෝග කර ඇත. වෝහාරික තිස්ස රජතුමා විසින් ශාරීරික වධහිංසා පැමිණවීම පහත්කොට හිංසා මුක්ත ව්‍යවහාර ඇති කළේය. ක්‍රි.ව. 323-33 කාලයේ සිහසුන දැරූ පළමු දෙටුතිස්ස රජතුමාට පක්ෂපාතී නොවූ ඇමතියන් සිය පියරජුගේ චිතකය වටා උලහිටුවා

මරණයට පත්කර ඇත. කාශ්‍යප කුමරු විසින් ධාතුසේන රජු බිත්තියකට තබා මැටි ගැසුබව මහාවංශයේ සඳහන් වේ.

බොහෝ විට රාජ්‍ය විරෝධී, කැරලිවලට දඬුවම වූයේ මරණය හෝ අංගඡේදනයයි. පළමු විජයබාහුට එරෙහිව කැරලි ගැසූ ඇමතිවරුන් අල්ලා උල තබා මරා දමන ලදී.[9] තවත් විටක රාජයට එරෙහිව සෙන්පතින් මරා කැරලි ගැසූ වේලක්කාර ප්‍රධානීන් විජයබාහු රජු විසින් ඒ සෙනෙවියන්ගේ දැවෙන සෑයන් වටාම කණුවල බැද පණපිටින් ම පුළුස්සා දමන ලදී.[10] මෙය කැරලි ගැසීමට හැම කල්හි දුන් පොදු දඬුවම් පටිපාටියට වඩා විශේෂ අවස්ථාවක් විය. රජුගේ ජීවිතාරක්ෂාවට දිවුරා බැදී සිටිමින් වැටුප් ලැබූ වේලක්කාරයන්ගේ කොන්දේසි කඩ කිරීමේ බරපතල වරදක් මේ සමඟ ඇතුළත් විය. පොළොන්නරුව යුගය වන විට පරාක්‍රමබාහු රජතුමා විසින් කැරලිකරුවන් උල හිඳුවා, එල්ලා මරා පුළුස්සා අළු කළ බව ද සඳහන්ව තිබේ.[11]

නූතන සමාජ කථිකාවේ පවුල් සංස්ථාව තුළ අණියම් සබඳතා දක්නට ලැබේ. එමගින් බිඳවැටෙන පවුල් ගණන බොහෝය. අතීතයේ ද එවැනි අවස්ථා තුළ ලබාදුන් දඬුවම් වුයේ මරණයයි. රජ බිසෝවරු හා අන්තඃපුර ස්ත්‍රීන් සමඟ යම් අයතා සබඳතාවයක් වූයේ නම් ඊට දුන් දඬුවම වුයේ මරණයයි. කැලණිතිස්ස රජතුමා රහතුන් වහන්සේ නමක් තෙල් කටාරමකට දමා මරවා ඇත.[12] වෝහාරිකතිස්ස රජුගේ බිසව හා අනියම් සබඳතාවක් පවත්වාගෙන ගිය රජුගේ සොහොයුරු අභයනාග කුමරු බියෙන් භල්ලතීර්ථයට පලා ගියේ රජු දැනගතහොත් මරණ දඬුවමට ලක් කරන බව දන්නා නිසාය.[13] සද්ධර්මාලාංකාරයේ සෝමදත්ත බ්‍රාහ්මණ කථාවෙන් ද පරදාර සේවනයට ලබාදුන් දඬුවම් පිළිබඳව සඳහන් වේ.[14] රජ බිසව හා අයථා සම්බන්ධතාවකට වැටී සිටි දස්කොන් අධිකාරම් මරණ දඬුවමට ලක්වීම උඩරට මෑත ඉතිහාසයේ ප්‍රකට සිදුවීමකි.[15] තවද අමානුෂික ලෙස මරණිය දණ්ඩනය පැමිණ වූ සිද්ධීන් ගැන මහනුවර යුගයේදී (ඇහැලේපොළ) දක්නට ලැබේ. රාජද්‍රෝහි වීමේ වරද මත පැමිණ වු දඬුවම අති අමානුෂික විය.

පුරාණ සිංහල පාලනතන්ත්‍රයේ දඬුවම්වලින් නිදහස් කිරීම සඳහා නීති ව්‍යවහාර පද්ධතියක් ක්‍රියාත්මක විය. මෙය මාඝාතය පිළිබඳ ව්‍යවස්ථාව වැන්නක් ලෙස පෙන්නුම් කළ හැකිය. අනුරාධපුරය ගැන අවධානය යොමු කිරීමේදී මාඝාත නියමය මත හිස ගසාදැමීමට නියම වුවනට සිර දඬුවම දී නිග්‍රහ කිරීම ද එම නිග්‍රහ කිරීමෙන් පසුව සිරදඬුවමෙන් පවා නිදහස් කිරීමට ද වැනි කාර්යන් ඉටු කළේ රජතුමා විසිනි. සිරිසඟබෝ මරණ දඬුවමට නියම වු අපරාධකරුවන් නිදහස් කොට එවැන්නන්ට දඬුවම් දෙන බවක් පෙන්වීමට මළමිනී ගෙන්වා දවාලු පුවතක් මහාවංශයේ සඳහන් වේ.[16] රටේ යම් යම් සුවිශේෂී අවස්ථාවදී වැරදිකරුවන්ට සමාව ලබාදුන් අවස්ථාද ඇත. මහා පරාක්‍රමබාහු උපන් අවස්ථාවේදී සතුටට පත් මහාභරණ පියරජු "සිරගෙයි බැඳි බොහෝ ජනයා මුදවා"[17] තිබේ. නිශ්ශංකමල්ල රජු ධනාශාව නිසා දිළින්දන් සොරකම්වලට යොමු වන නිසා ඔවුන්ට කැමති පමණ වස්තු දුන් බවට ගල්පොත්ත ලිපිය සාක්ෂි දරයි.[18] පළමු විජයබාහු රජතුමාගේ පනාකඩු තඹ සන්නසට අනුව මිනිමැරුම් වරදට වුවද තුන්වරක්ම සමාව දිය යුතු වග පෙන්වා ඇත.[19] මිනිසුන්ට අභයදානය දීම පමණක් නොව තිරිසන්ට ද අභයදානය දීමේ ප්‍රතිපත්තියක් තිබිණි. අනුරාධපුරයේ ප්‍රධාන වැව් 12ක මසුන් මැරීම් තහනම් කර තිබූ අතර පරාක්‍රමබාහු රජතුමා තිරිසන්

සතුන්ට ද අභයදානය දුන්බව සඳහන් වේ. මාඝාතයෙන් අදහස් කරන ලද්දේ මිනිසුන් ප්‍රාණඝාතයෙන් වළක්වා සමාජයෙහි හොඳ පුරවැසියෙකු කිරීමය. බුදුසමය පිළිගැනීමෙන් පසුව වුවද සතුන් මැරීම සම්පූර්ණයෙන් ම නතර නොවූ බව ඒ පිළිබඳ වරින්වර නීතිරීති, අණපනත්, ව්‍යවස්ථා පැනවීමෙන් පෙනේ.

පුරාතනයේ පැවති තවත් වරදක් වූයේ පස්මහ වරදයි. මේ පිළිබඳ පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපියෙහි තොරතුරු සඳහන් වේ. මෙය බෞද්ධයන් විසින් සලකනු ලබන්නේ පංචානන්තරීය කම්ම නම් ලෙසිනි. මව් මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, පෙති පිළිම වැනසීම සහ අන්‍යාගම් ඇදහීම යන පුරාණ සිංහලයන් විසින් පස්මහවරද ලෙස සැලකූ බව විමලකිර්ති හිමියෝ පවසති. පස්මහ වැරැදි ගණයෙහිලා ගැනුණේ එලොව මෙලොව දොලොවටම අහිතකර අපචාර්ය විශේෂයක් විය හැකිය.

වර්තමානයේදී දණ්ඩනීති සංග්‍රහයට අනුව සොරකම වරදක් ලෙස ගැනෙන අතර ඊට හිමි දඬුවම සොරකමේ ස්වභාවය අනුව තිරණය වේ. සොරකම් කිරීම මරණීය දඬුවම පවා ලැබීමට හේතුවන අපගාමී චර්යාවක් ලෙස පැරැණි සිංහල සමාජයේ පැවති බවට වේවැල්කැටිය ලිපියෙන් පැහැදිලි වේ.[20] මෙහිදී රජුට අයත් භාණ්ඩ සොරකම් කළේ නම් හිමි වූ ඉහළම දඬුවම වූයේ මරණයයි. මීට අමතරව කසපහර දීම, රාජසත්තක කිරිම වැනි දඬුවම් ද දුන් බවට තත්කාලීන සහිත්‍ය මුලාශ්‍ර සාක්ෂි දරයි. විශේෂයෙන් ම මෙම කාලයේ සතුන් සොරකම් කිරීමට එරෙහිව දඬුවම් ක්‍රියාත්මක විය. සතුන් නොමරා සොරගෙන යනු අසුවුවහොත් ඒ සොරුන් අල්ලා කිහිල්ලේ හණ ගසා යැවිය යුතු යැයිද සඳහන් වේ. තවද එකොළොස් වැනි සියවසට අයත් සේ සැලකෙන සෙල්ලිපියක හරක් සොරුන්ට දුන් දඬුවම් ගැන සඳහන් වේ. "මීමුන් , ගෙරිගොන්, එළුවන් මරුවන් මරා පට්වනු කොට් ඉසා නොමරා සොරා ගෙනැ ගිය නියත කොට් ඔවුන් ඔවුන් කසිලැ සන්ලකණ් ඔබා හර්ණා කොට් ඉසා තිරූ නොවත් කොටා පටයනු ඉසා.[21] මේ අනුව පැහැදිලි වන්නේ හරක් හොරුන්ට වත්මන් නීතිය අනුව ලිහිල් භාවයක් පැවතුන ද අතීතයේ දැඩි දඬුවම් ලබාදීමක් සිදු කළ බවයි. යම් සමාජයක හොරකම් සිදුවේ නම් එය සමාජයේ පැවැත්මට බාධාවකි. මිනිසුන් ජිවත ආශාව අතහැර සොරකමේ යෙදෙන්නේ ආශාව නිසා බවත් එනිසා ඔවුන්ට වස්තුව ගම්බිම් ප්‍රදානය කළ බව නිශ්ශංකමල්ල රජුගේ ලිපිවල සඳහන් වේ. ඔහු එසේ සිදු කරන්නට ඇත්තේ සමාජය යහපත් ආකාරයෙන් පවත්වා ගැනීමටත් වරද කළ වුන් පුනරුත්ථාපනය කිරීමට විය හැකිය. සොරකමට මරණ දඬුවම සිංහල නීතියට අනුකූල බව මහනුවර සංඝ සභාව ලන්දේසි ආණ්ඩුකාර විල්හෙල්ම් පැල්ක්ට දැනුම් දී ඇත.[22] සොරුන් අල්ලා අත් පිටුපසට බැඳ කසයෙන් තලමින් මාර්ග වීථිවල ගෙනාමේ කථා සද්ධර්මාලංකාරයේ එන චෝරමිත්‍ර කථාවෙන් පැහැදිලි වේ.

අසම්මත ලිංගික සේවනය සමාජ අපගාමී චර්යාවක් ලෙස සිංහල සමාජය සැලකුහ. බෞද්ධ ධර්මය තුළ ද මෙය මැනවින් විග්‍රහ කර ඇත. මෙම ක්‍රියාවෙහි යෙදුන කාන්තාවට හෝ පුරුෂයාට එකල දැඩි දඬුවම් පැමිණ වූ බව සඳහන් වේ. පරදාරසේවනයෙහි යෙදුන බිරිඳකට තම ස්වාමි පුරුෂයා දුන් දඬුවමක් ගැන ජෝන් ඩේවි සඳහන් කරයි. ඒ වගේම මහනුවර යුගයේ සිටි යැයි ප්‍රකට දස්කොන් අධිකාරමට හිස් ගැසුම් කැමට සිදු වුයේ රජ බිසව සමඟ අනාචාරයේ හැසිරීම නිසාය.

මෙය තුළින් පැහැදිලි වන්නේ සමාජයේ ඉහළ ස්ථරයේ සිට පහළ ස්ථරයේ පුද්ගලයා දක්වා සිදුකරන මෙවැනි ක්‍රියා සමාජය පිළිකුල් කරන ආකාරයකි.

බොරු කීම, කේලම් කීම වැනි දුෂ්චරිත සඳහා ද එකල දඬුවම් ක්‍රම පැවති බව පෙනේ. සිංහලයන් ගැන සඳහන් කරන රොබට් නොක්ස් ඔවුන් කඩිසර හුරුබුහුටි ගුණ හා දක්ෂකම් ඇති අභිමානවත් අහංකාර පරවශ අලංකාරය ප්‍රිය කරන ජාතියක් වන නමුත් ඔවුන් ඉක්මවා දක්ෂ වංචනික පුද්ගලයෝය. මේ ජනතාවගේ ගතිසිරිත් නොදත් නුහුර කවුරුන් නමුත් ඉතා පහසුවෙන් මුලාවන තරමට ඔවුන්ගේ කතා මිහිරිය, ඇඟට පතට නොදැනි බොරු කියයි."[23] නොක්ස් එදා පැවති තත්ත්වය මෙසේ විවරණය කළ ද සමස්ත සමාජයේ ම මෙවැනි තත්ත්වයන් දක්නට නොවීය. බොරුකීම නිසා එදා රටින් පිටුවහල් කිරීමේ නීතියක් පැවති බව ධර්මසේන හිමියන් පෙන්වා දේ. බොරු කියන්නා සාහසික අපරාධ කරන්නෙකුටත් වඩා සාරධර්ම බිඳ දමන්නෙකු ලෙස පිළිගැනුනේය.

පැරැණි සිංහල සමාජයෙහි සුරාපානය පැවති බව පෙනේ. බෞද්ධ සමාජය සුරාපනය ඉඳුරාම අනුමත කරනු නොලබන්නකි. දුටුගැමුණු කථාවට සම්බන්ධ දශ මහා යෝධයන් ගැන කියවෙන විට ගෝඨයිම්බර යෝධයාට සුරා කළ සොළසක් පානය කරන්නට හැකි බව කියැවේ. එමෙන්ම පසු අවධිය වනවිට පළමු විමලධර්මසූරිය සුරාපානය කරන්නා කිසිවකට නොහොබිනා අයෙකු බව ප්‍රකාශ කර ඇත. සුරාපානය සමාජයට මහත් ව්‍යසන ගෙනදෙන දෙයක් බවත් සුරාපනය ගැන සිංහල රජුන් තුළ පැවති ආකල්පයන් මේ තුළින් පැහැදිලි වේ.

සිංහල රාජ නීතිය බොහෝ සෙයින් බෞද්ධ නීතියට අනුකූල විය. භික්ෂූන් ද රාජනීතියට අනුවර්දිත විය යුතු බව විනය නීති පැනවීමේදී බුදුරජාණන් වහන්සේ වදාළ සේක. විශේෂයෙන්ම මෙරට පාලනය සිදු කළේ විනය නීතියට අනුවර්ථනය වීමෙනි. අප මුලින් පෙන්වූ පරිදි දඬුවම නියම කරන ලද්දේ අපරාධයේ තරම විනිශ්චය කිරීමෙන් පසුවය. පොදුවේ මුළුමහත් සමාජ සංස්ථාව තුළ ද දණ්ඩ නීතිය ජනිත කරවන පරිද්දෙන් අපරාධ වෙනුවට ප්‍රතික්‍රියා දක්වනු සඳහා කාර්ය සම්පාදනය සිංහල බෞද්ධ සමාජ පාලනයෙහි මුල් තැනක් දී ඇත්තේය. වධ, වධකස්ථාන, වධ පෙරහැර, බධ බෙරය, අලුගෝසුවා, දං ගෙඩිය, සිපිරිගේ ආදී දඬුවම් දීමට ධ්වනි කරවන්නේ භීතියෙනි. අපරාධ කළහොත් දඬුවමට මුහුණ දීමට සිදුවන බවත් පුද්ගලයන් තුළ භිය ඇතිකරවා අපරාධවලින් මිදීමට පෙළඹවනු පිණිස කිසියම් බලපෑමක් සිදු වුවා විය හැකිය.

පෝරකය හා අලුගෝසුවා යන වචන පෘතුගීසි තත්සම ශබ්දයන්ය. එනිසා එල්ලුම් ගහ යුරෝපීය ආගමනයට ප්‍රථම මෙටර පැවති බවට සාක්ෂි අවිද්‍යමානය. බොහෝ විට පැරණි සිංහල රජුනගේ දඬුවම් වරදේ සීමාවන් ඉක්මවා ගිය කෲර ඒවා ලෙසට පවතින ප්‍රවාද යටත්විජිත යුගයේ විදේශිය ලේඛනයන් උපුටා දැක්වීමෙන් ඇති කරන ලද මතවාදයකි.[24]සීඝ්‍ර සමාජ වෙනස්වීම් හා චල්‍යතාවයන් ප්‍රදර්ශනය වන 17, 18, 19 ශතවර්ෂ තුළ මෙරට සමාජය තුළ හා සමාජ නීති රීති හා දඬුවම් ක්‍රමවල දැඩි වූ ඔවුන් නොමඟ යාමට එක් හේතුවක් විය. ඉංග්‍රීසින් විසින් මෙරට පැරැණි දඬුවම් අහෝසි කිරීමෙන් පසුව එල්ලා මැරීම මෙරට පිළිගත් මරණ දණ්ඩන ක්‍රමය විය. ඊට කලින්

ලන්දේසින් විසින් එල්ලා මැරීම් කළ බවට බාල්දියස්ගේ විස්තරවලින් පෙනේ. නූතන යුගයේ බොහෝ රටවල මරණ දඬුවම අවලංගු කර ඇත. ලංකාවේ එය 1958 දී අත්හිටවනු ලැබුව ද නැවතත් 1959 වලංගු කරනු ලැබීය. එනමුත් වර්තමාන සමාජයෙහි පවතින නොයෙක් අපරාධ මැඩ පැවැත්වීම සඳහා එහි අවශ්‍යතාවය මැනවින් පැහැදිලි වේ. මේ ආකාරයට පැරණි සිංහල ක්‍රමයට අනුව ලබාදුන් දඬුවම් ක්‍රම මගින් පුද්ගල සදාචාරයත් සමාජ අභිවෘද්ධියත් අපේක්ෂා කර ඇත. මේ නිසා සමාජයේ පැවැත්ම සමකාමී ස්වරූපයක් ගනු ලැබීය.

අන්ත ලිපි


1 විද්‍යාලංකාර, අනුත්තරාදේවි, **පැරණි ලක්දිව නිතිය හා අධිකරණය**, කතෘ ප්‍රකාශන, කොළඹ, 2000, පිටු, 150.
2 විමලවංශ, බද්දේගම, **සෙල්ලිපි සමාජය**, අනුලා මුද්‍රණාලය, කොළඹ , 1955, පිටු 66.
3 **එම**, පිටු 67.
4 නොක්ස්, රොබට්, **එදා හෙළදිව**, පරි. ඩේවිඩ් කරුණාරත්න, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1995, පිටු 141.
5 **මහාවංශය**, පරි. 8, ගාථා 3 -4.
6 **එම**, පරි. 10, ගාථා, 7 - 14.
7 **එම**, පරි 35, ගාථා, 60 - 61.
8 **එම**, පරි 37, ගාථා, 22.
9 **එම**, පරි 58, ගාථා, 43.
10 **එම**, පරි 73, ගාථා, 161 - 190.
11 **එම**, පරි 11, ගාථා, 17 - 19.
12 **මහාවංශය** පරි. 30, ගාථා, 80- 81.
13 **එම**, පරි 12, ගාථා, 42 - 43.
14 **සද්ධර්මරත්නාවලිය**, සංස්. කිරිඇල්ලේ ඥාණවිමල, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1996, පිටු 114.
15 තෙන්නකෝන් විමලානන්ද, **උඩරට මහා කැරැල්ල**, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1963, පිටු 271.
16 **එම** පරි. 62, ගාථා, 41.
17 **Epigraphia Zeylanica**, Vol. II P, 106.
18 **සෙල්ලිපි සමාජය**, පිටු. 161.
19 සිල්වා මයිකල් ද, **පනාකඩුව තඹ සන්නස**, සමන්ති පොත් ප්‍රකාශන, 2003, 60- 85.
20 **Epigraphia Zeylanica** ,Vol. III P, 281.
21 අභය ආරියසිංහ, "**ලංකාවේ රජ සිරිත් හා ලෝක චාරිත්‍ර**" සංස්. අන්තර් සංස්කෘතික භාරය, නුගේගොඩ, 1985, පිටු 10.
22 **සද්ධර්මරත්නාවලිය**, පිටු- 254-266.
23 **එදා හෙළදිව**, පිටු 168.
24 ගමගේ ගුණසේන, **පැරණි හා මධ්‍යකාලීන ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය**, සරස්වතී ප්‍රකාශන,2008, පිටු 127.



- ටී.ජී. අජිත් තලවත්ත B.A. (Special) M.A.(PDN) M. Phil (KNL)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය,
සමාජ විද්‍යා හා  මානව ශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.